# දෘෂ්ටිවාදී සංවරණය සමකාලීන රූපවාහිනී ප්‍රවෘත්තිකරණයේ දී භාවිත වන ආකාරය

**ආචාර්ය ටියුඩර් වීරසිංහ**

සමස්ත සංහතික මාධ්‍ය පද්ධතිය තුළ ප්‍රවෘත්තිකරණයට අයත් වන්නේ තීරණාත්මක වූ ද, බලපෑම් සහිත වූ ද භූමිකාවකි. විශේෂයෙන් සංහතික මාධ්‍ය සමාජ යථාර්ථය නිරූපණය කිරීමේ, එය ඉදිරිපත් කිරීමේ , එය පරිවර්තනය කිරීමේ, නූතන ස්වරූපයක් පමණක් නොව අද්‍යතන සංහතික මාධ්‍ය සමාජ යථාර්ථය අර්ථකථනය කිරීමේ එය සංවිධානය කිරීමේ සහ නිර්මාණය කිරීමේ ප්‍රබල ආයතනයක් ලෙස ඉදිරිපත් වේ. දෛනිකත්වය, කාලීනත්වය තත්ත්වාකාරය ආදී මානව සත්තාවේ වඩාත් සංවේදී වඩාත්ම සක්‍රිය ගතික ප්‍රවණතා විචල්‍යතා ඉදිරිපත් කිරීමේ සමාජයීය වශයෙන් තත්ත්වාරෝපිත ආයතනයක් වශයෙන් සංහතික මාධ්‍ය හැඳින්විය හැකි ය. සමාජයේ දෛනික ගතිකත්වය පිළිබඳ සවිඥානිකත්වය ක්‍රමානුකූලව ඇති කිරීම් අවශ්‍යතාව මානව සමාජ පරිණාමයත් සමගම අවශ්‍යයික ස්වරූපයක් බවට වර්ධනය වන්නට විය. සමාජ විෂය -වේදක වේදක-වේදක අතර සම්බන්ධතා සංකීර්ණවත්ම දෛනිකත්වය පිළිබඳ සංවිඥානිකත්ව පිළිබඳ සාධකය වැදගත් භූමිකාවක් ඉටු කරනු ලැබේ.

මානව වර්ගයාගේ ඉතිහාසය තුළ ප්‍රවෘත්තිකරණයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. මිනිසාගේ සන්නිවේදන අවශ්‍යතා සංතෘප්තිමත් කිරීම මාන ඉතිහාසය තුළ ප්‍රවෘත්තිකරණය බිහි වීමට සහ වර්ධනය වීමට ප්‍රබලතම හේතුවක් විය. එනම් මිනිසාට සමාජමය වශයෙන් වැදගත් තොරතුරු සම්පාදනය කිරීමයි. ප්‍රාග් ඓතිහාසික යුගයේ දී මිනිසා සන්නිවේදන මාධ්‍යයක් ලෙස

ඉදිරිපත් විය. විශේෂයෙන්ම මානව සමාජය සහ රාජ්‍ය යාන්ත්‍රණය අතර සහසම්බන්ධය පුළුල් වමත් සමග සමාජ සන්නිවේදනාත්මක අවශ්‍යතාව සංකීර්ණ වූ අතර ඒවා කාර්යක්ෂමව සහ වඩාත් ඵලදායිකව ඉටු කිරීම සඳහා ප්‍රවෘත්තිකරණය අතිශය වැදගත් අංගයක් බවට පත් විය.

ක්‍රි.පූ. 16 වන සියවසේ දී පැරණි ඊජිප්තුවේ පාරාවෝ (Pharaoh) නම් රාජ මාලිගයේ පැපිරෝසි පුවත්පතක් පැවැති බව ප්‍රකට කරුණකි. එහෙත් ඊට වඩා විධිමත්ව සහ සංවිධානාත්මකව මානව සමාජයේ ප්‍රවෘත්තිකරණයේ ප්‍රාරම්භක අවස්ථාවක් සනිටුහන් කරන්නන් පැරණි රෝම අධිරාජ්‍යකු වූ ජූලියස් සීසර්ගේ නියෝගයකට අනුව ක්‍රි.පූ. 60 - 59 දී ආරම්භ වූ Acta Diurna Populi Romani (රෝම ජනතා දිනපතා ප්‍රවෘත්ති), Acta Senatus (සෙනට් සභා ප්‍රවෘත්ති) සියවසක පමණ කාලයක් පවත්වාගෙන යන ලදී. මෙහි දී අපට වැදගත් වන්නේ මේ එක් එක් පූර්ව පුවත්පත්, ප්‍රාග් පුවත්පත්, බිහි වූයේ කවදා ද, ඒවා බිහි වූයේ කුමන ස්වරූපයෙන් ද කුමන ආකෘතියෙන් ද ඒවා කොපමණ කල් පැවතුණා ද, ඒවායේ සංස්කාරකත්වය, ප්‍රකාශනය ආදිය සම්බන්ධව මූලිකත්වය ගත්තේ කවුද යන්න නොවේ. මින් පෙර මිනිසා, මානව සමාජය උනන්දුවක්, අවධානයක් නොදක්වන ලද මානව සමාජ ක්‍රියාකාරීත්වයේ සුවිශේෂීය පැතිකඩක් වශයෙන් දෛනිකත්වය හා සම්බන්ධ වූ සමාජ දේශපාලන, සංග්‍රාමික, ආදී ක්‍රියාකාරකම්, පිළිබඳව නිරන්තරව ජනයා, සංහතික මිනිසා සවිඥානනය කිරීමේ සමාජ දේශපාලනික සාහිත්‍ය ප්‍රකාශනාත්මක ස්වරූපයක් ලෙස ප්‍රවෘත්තිකරණය නැමැති සංසිද්ධිය මානව වර්ගයාගේ සමාජ පරිණාමයේ ප්‍රතිඵලයක් වශයෙන් බිහි වීම ය. මින් පෙර මානව සමාජ දෛනිකත්වය සම්බන්ධව කටයුතු කරන සමාජයීය ආයතනයක් නොවීය. ජන ශ්‍රැතිය, ජන කතාන්දර, පුරාණෝක්තිවේදය, ආගමික, දාර්ශනික ආදී සමාජ විඥානයේ යම් යම් ස්වරූපයන් පැවතිය ද දෛනිකත්වය එනම් දිනපතා සිදුවන වැදගත් දේවල් වාර්තා කිරීමේ, ඉදිරිපත් කිරීමේ ඒ සම්බන්ධව මිනිසා සවිඥානනය කිරීමේ ගතික වූ ද කාලීන වූ ද සක්‍රිය වූ ද තත්ත්වාකාර වූ ද අඛණ්ඩ වූ ද ස්වරූපයක් නොවී ය. එය බිහිවීම සනිටුහන් වන්නේ මානව සමාජය සංකීර්ණවත් ම එහි සමාජ සන්නිවේදන අවශ්‍යතා ඉටුකිරීම සඳහා නව ස්වරූපයක් වශයෙන් ප්‍රවෘත්තිකරණය බිහි වීමෙනි.

සංහතික සන්නිවේදන මාධ්‍ය සහ ප්‍රවෘත්තිකරණය අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවකි. සමස්තයක් ලෙස සංහතික සන්නිවේදන මාධ්‍ය දෛනික යථාර්ථය නිරූපණයේ ඉදිරිපත් කිරීමේ, නිර්මාණය කිරීමේ එකම වූ ද අද්විතීය වූ ද පොදු වූ ස්වරූපය වන අතර එහි ප්‍රවෘත්ති යනු වඩාත් ම සක්‍රිය, ජංගමශීලී වඩාත්ම ගතික ස්වරූපය වන්නේ ය. එය දින දින එදිනෙදා දෛනික යථාර්ථයට දක්වන ලද ප්‍රතිචාරයකි. සමකාලීන පොදු ප්‍රවෘත්ති සංකල්පය තුළ ප්‍රකට ලක්ෂණ ලෙස දක්වන නිවැරදි බව, සමබරතාව සහ විශ්වාසනීයභාවය හුදු මනෝමූලික නිර්ණායක බවට පත් වී ඇති බව පෙනේ. ප්‍රවෘත්ති යනු හුදු නිවැරදිභාවය සමබරතාවය හා විශ්වසනීයභාවය මත පදනම් වන දෛනික යථාර්ථයේ පරාවර්තිත ස්වරූපයකට වඩා නිශ්චිත සමාජ දේශපාලන සහ සංස්කෘතික දෘෂ්ටිවාදී කොන්දේසි මත තත්ත්වාරෝපිත වන සංහතික විඥාපන ක්‍රියාකාරිත්වයේ ස්වරූපයකි. එය සමාජ යථාර්ථය දෛනිකත්වයේ පරාමිතීන්වලට අනුකූලව යථාර්ථය සංහතික මිනිසා සඳහා ඉදිරිපත් කරන ආකාරයකි. එහි විශේෂත්වය වන්නේ සමාජ යථාර්ථය දෛනිකත්ව රාමුව තුළ ඉදිරිපත් කරනු ලබන්නන් සංහතික, මතයේ, ජනමතයේ මූලධර්මවලට අනුකූලවන ආකාරයට වීමය.

පොදු පිළිගැනීම වන්නේ ප්‍රවෘත්තිවල දී විශේෂයෙන් සාධක ඉදිරිපත් කරන අතර එහි විවරණවලට ඇති ඉඩකඩ අතිශයින් ම සීමා සහිත හෝ විවරණ රහිත ය. ඒවා උපරිම වශයෙන් විෂය

මූලික වාස්තවික සහ පාරදෘශ්‍යතාව ප්‍රදර්ශනය කළ යුතු ය. එහෙත් බොහෝ පර්යේෂකයන් පෙන්වා දෙන්නේ සංහතික මාධ්‍ය පඨනයකට නිරපේක්ෂව විෂය මූලික, වාස්තවික මධ්‍යස්ථ විය නොහැකි බවයි. මේ අනුව කිසිම ප්‍රකාශයක් නිරපේක්ෂ වශයෙන් මධ්‍යස්ථ විය නොහැකි ය. සමාජයීය වශයෙන් වැදගත් ඕනෑම ප්‍රකාශනයක් විවිධ පුද්ගල, කණ්ඩායම්, සමාජ පන්ති, සමාජ බලවේග අතර වුවමනාවන් අවශ්‍යතා සඳහා වූ බල අරගලයේ ප්‍රකාශනයක් ලෙස සැලකිය යුතු ය. ඉන් අදහස් වන්නේ කිසිම ප්‍රවෘත්තියක් තුළ දේව හෝ වියුක්ත නිවැරදි බවක්, සමබරතාවක්, විශ්වාසනීයත්වයක්, සාධාරණත්වයක් අපේක්ෂා කිරීම මුළාවකි. එය මිනිසාගේ හුදු ක්‍රියාකාරීත්වයේ හෝ මාධ්‍ය ආයතන හෝ මාධ්‍ය කරුවන්ගේ ප්‍රශ්නයක් නොව මානව සමාජ සත්තාවේ සහ එය ක්‍රියාත්මක වීමේ මූලික නියමයක් වීම නිසාය. මෙම සමාජ බලවේගයන්ගේ ක්‍රියාකාරීත්වය පාදක කොටගෙන යථාර්ථය අර්ථකථනය කිරීමේ විවිධ විකල්පීය මාහයන් ඉදිරියට පැමිණීමත්, ඒවා සංහතික මාධ්‍ය ප්‍රවෘත්ති ප්‍රකාශන තුළ විද්‍යමාන වීමත් වැළැක්විය නොහැකි ය. වර්තමානයේ ලාංකේය රූපවාහිනිය දෙස බැලීමේ දී මෙම ප්‍රවාදයේ හරය දැකිය හැකි ය. ක්‍රමානුකූලව ශ්‍රී ලාංකේය රූපවාහිනිය සංහතික විඥාපනයේ සිට දේශපාලන බලපෑමේ උපකරණයක් බවට පරිවර්තනය වෙමින් පවතී. තවම ක්‍රියාවලියෙන් විනිර්මුක්තව සිටීමට රූපවාහිනී ප්‍රවෘත්තිවලට ද හැකි වන්නේ නැත.

වර්තමාන රූපවාහිනී ප්‍රවෘත්ති සමාජය සම්බන්ධව බහුකාර්ය පරාසයක් ඔස්සේ ක්‍රියාත්මක වුවත් එහි ආධිපත්‍යයික ක්‍රියාකාරී ස්වරූපය වන්නේ සමාජ-දේශපාලන ක්‍රියාවලියේ තීරණාත්මක උපකරණයක් ලෙස ක්‍රියා කිරීමයි. ශ්‍රී ලංකාවට ආවේණික රූපවාහිනී ප්‍රවෘත්තිකරණ සංකල්පයක් නිර්මාණය වීමෙහි ලා සාධක කිහිපයක් බලපා ඇත. පශ්චාත් යටත්විජිතවාදී විඥාපන අවකාශය සිංහල - බෞද්ධ දෘෂ්ටිවාදය යටත්විජිත ප්‍රජාතන්ත්‍රවාදය පශ්චාත් ප්‍රජාතන්ත්‍රවාදය සංග්‍රාමික හා පශ්චාත් සංග්‍රාමික තත්ත්වයන් මෙන්ම සමකාලීන වෙළෙඳපොළ ගතිකයන් ඒ අතර වැදගත් වේ. සමාජයේ සිදුවන දේශපාලන සංස්කෘතික ආදී ඕනෑම සිදුවීමක් සංහතික මාධ්‍ය මගින් ඉහත ගෙන හැර දක්වන ලද සාධකවලට සහ තාර්කනයට අනුරූප වන ආකාරයට ගොඩනගන්නේ ය.

මෙම තත්ත්වය වඩාත් ම වැදගත් වන්නේ සංහතික මාධ්‍ය ක්‍රියාකාරීත්වය නිශ්චිත දේශපාලන ප්‍රතිඵල ලබා කර ගැනීමේ මාධ්‍යයක් වශයෙන් විශ්ලේෂණය කිරීමේ දී ය. සංහතික මාධ්‍ය ඇතුළු රූපවාහිනී ප්‍රවෘත්ති නිශ්චිත දේශපාලන සමාජ සන්දර්භයක් තුළ අධ්‍යයනය කිරීම වඩාත් ආකර්ෂණීය වන්නේ ය. සංහතික මාධ්‍ය සන්දේශවල දෘෂ්ටිවාදී සංරචකය ප්‍රබල තත්ත්වයක් අත්පත් කර ගන්නේ අදාළ මාධ්‍ය සන්දේශය සන්දේශනය වන දේශපාලන - සමාජ සන්දර්භයේ නිර්ධාරිත ස්වභාවය නිසා ය. සංහතික මාධ්‍ය සන්දේශය තුළ යථාර්ථය මධ්‍යස්ථව පරාවර්තනය කිරීමේ දී පවා එහි දෘෂ්ටිවාදය සැඟවූ ස්වරූපයෙන් පවතින බව නව මාක්ස්වාදී සංහතික මාධ්‍ය අධ්‍යයනයන් මගින් අනාවරණය කෙරේ. "විශේෂයෙන්ම මේ තත්ත්වය රූපවාහිනී සහ එහි ප්‍රවෘත්ති සම්බන්ධව සලකා බලන කල පෙනී යනු ඇත (වීරසිංහ, ටී. 2011)."

සමකාලීන රූපවාහිනී ප්‍රවෘත්ති පැහැදිලිව ම අද්‍යතන දේශපාලන යථාර්ථය නිර්මාණය කිරීමට, සංස්කරණය කිරීමට, නිරූපණය කිරීමට පුළුල් දායකත්වයක් සපයන බව අවධාරණය කළ යුතු ය. මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුත්තේ සංහතිකයන් නිවේදනය මාධ්‍යයක් වශයෙන් රූපවාහිනී මාධ්‍ය ප්‍රවෘත්ති සම්පාදන ක්‍රියාවලිය තුළ දී දේශපාලන සංසිද්ධීන් ප්‍රතිනිර්මාණය කරනවා පමණක් නොව ඒවා නිර්මාණය ද කරන්නේ ය. මෙහි දී අප දැනටමත් අවධාරනය කළ රූපවාහිනී මාධ්‍ය ක්‍රියාත්මක වන සමාජ දේශපාලන පරිස්ථිතිය තීරණාත්මක බලපෑම පමණක් නොව සංගතික

සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් රූපවාහිනී මාධ්‍යයටම ආවේණික වූ ගතිලක්‍ෂණ ද දායක වන බව පෙන්වා දිය යුතු ය. විශේෂයෙන් රූපවාහිනී ප්‍රවෘත්ති ප්‍රජනනයේ ශෛලීය විශේෂතා අදාල මාධ්‍යයේ ශ්‍රව්‍ය දෘශ්‍ය ගති ලක්‍ෂණ මගින් තත්ත්වාරෝපණය කරන බව සඳහන් කළ යුතු ය.

දෘෂ්ටිවාදී සංවරණය ඔස්සේ සමකාලීන රූපවාහිනී මාධ්‍ය ප්‍රවෘත්ති මගින් සමාජ යථාර්ථය නිර්මාණය කිරීම සඳහා රූපවාහිනී මාධ්‍යයේ අභ්‍යන්තර ගති ලක්‍ෂණ ස්වයංක්‍රීයව දායක වනවා නොව, එය නිශ්චිත සමාජ දේශපාලන ගතිකයන් මගින් අවසාන විග්‍රහයේ දී තත්ත්වාරෝපණය වන බව ලෝකයේ විවිධ සමාජවල රූපවාහිනී මාධ්‍ය ක්‍රියාත්මක වීමේ අත්දැකීම් පෙන්වා දෙනු ලැබේ. එහෙත් මෙමගින් ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍යයක් වශයෙන් රූපවාහිනී ප්‍රවෘත්ති හා දෘෂ්ටිවාදී සංවරණ යන්ත්‍රණය ඔස්සේ සමාජ යථාර්ථය නිර්මාණය කිරීම අදාළ මාධ්‍ය සතු නෛසර්ගික ශක්‍යතාව අවතක්සේරුවට ලක් නොකරන බව සඳහන් කළ යුතු වන්නේ ය.

මීට අමතරව අප මේ කතා කරන රූපවාහිනී ප්‍රවෘත්ති සමාජ යථාර්ථය නිරූපණය කිරීමට ආධාරක වන්නේ ද? එය ඊට බාධා කරන්නේද යන්න ඉතා වැදගත් ප්‍රශ්නයකි. එසේම රූපවාහිනී ප්‍රවෘත්ති මානව චර්යා සංරක්‍ෂණය කිරීමේ සහ ප්‍රති උත්පාදනයේ මාර්ගයක් වශයෙන් විමසා බැලීම ද කාලීනව වැදගත් ගැටලුවකි. මීට අමතරව සමකාලීන සමාජ සංවර්ධනයේ, ගෝලීයකරණයේ, තත්වාසන්න, යථාර්ථකරණයේ ගතිකත්වයට සමගාමීයව රූපවාහිනී ප්‍රවෘත්ති සඳහා වඩාත් ප්‍රශස්ත ස්වරූප ගවේෂණය කිරීම කාලීන අවශ්‍යතාවක් බවට පත්ව ඇත.

වර්තමානයේ අප ජීවත් වන්නේ සංහතික සන්නිවේදන මාධ්‍ය නාලිකාවල ප්‍රමාණාත්මක වූ ද ගුණාත්මක වූ ද තාක්‍ෂණික, තාක්‍ෂණිකවේදී වෙනස්කම් සිදුවෙමින් පවතින යුගයකය. නිදර්ශනයක් වශයෙන් පුද්ගල ජීවිතය පොදු සමාජ සන්දර්භය සමග සමකාලීනකරණය කිරීමේ ප්‍රවණතාව දැක්විය හැකි ය. මෙමගින් සමාජයේ සිදුවෙමින් පවතින වෙනස්කම්වල ඍජු සහභාගිකයෙක් ලෙස සැබෑ කාලය තුළ කටයුතු කිරීමට අවස්ථාවක් රූපවාහිනී ප්‍රේක්‍ෂකයාට ලැබේ.

මේ නව වෙනස්වීම් තුළ බටහිර රූපවාහිනියේ ක්‍රියාකාරී සම්ප්‍රදායන් යාන්ත්‍රික වශයෙන් ජාතික රූපවාහිනියේ පද්ධතිවලට ආරෝපණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඒවා සතු ජාතික හා සංස්කෘතික අනන්‍යතාව විනාශ වී යාමේ ප්‍රවණතාවක් ද ප්‍රදර්ශනය වේ. මෙය එක් අතකින් සමකාලීන මානව ශිෂ්ටාචාරයේ වර්ධනයේ පොදු නියමයන් සමග සම්බන්ධතාවක් දක්වමින් රූපවාහිනියේ ප්‍රවෘත්තිවල ගෝලීයකරණය පෙන්වන අතර අනෙක් අතින් එය ජාතික හා සංස්කෘතික අනන්‍යතා ස්වරූප සමග නොවැළැක්විය හැකි ප්‍රතිවිරෝධතාවකට පාදක වන්නේ ය. මෙය සමස්තයක් වශයෙන් සමකාලීන රූපවාහිනී ප්‍රවෘත්ති ඇතුළු රූපවාහිනී මාධ්‍යයේ වර්ධනයේ පොදු ගෝලීය ප්‍රවණතාවක් බව පෙන්වා දිය යුතු ය.

සමකාලීන සංහතික සන්නිවේදන මාධ්‍යයන්ගේ වර්ධනය විශේෂයෙන්ම එහි වඩාත් ක්‍රියාකාරී බලපෑම් සහිත මාධ්‍යයක් ලෙස රූපවාහිනී මාධ්‍යයේ හා එහි ප්‍රවෘත්තිවල වර්ධනය වර්තමාන බලය සමග වන අන්‍යෝන්‍ය සම්බන්ධතාවේ ගැටලුව උග්‍ර කිරීමට හේතු වී ඇත්තේ ය. වර්තමානයේ මාධ්‍ය යථාර්ථය නිර්මාණය කිරීමේ ගති ලක්‍ෂණ කෙරෙහි මාධ්‍ය බාහිර කණ්ඩායම්වල බලපෑම ප්‍රබල වී ඇත. සමාජයෙහි ක්‍රියාත්මක වන ප්‍රබල සංහතික සන්නිවේදන මාධ්‍ය පද්ධතිය කාර්යක්‍ෂම ප්‍රචාරණාත්මක යන්ත්‍රණය මත ප්‍රභූ පාලක පන්තිය සිය ආධිපත්‍යය පවත්වාගෙන යමින් පුද්ගල සහ සංහතික විඥානය අතථ්‍යවිඥානයට හා මෙහෙයවීමට ලක් කිරීමේ ප්‍රවණතාව උග්‍ර වන්නේ ය. බලය විමධ්‍යගත වෙමින් ප්‍රදේශය, දේශපාලන, ආර්ථික මූල්‍ය ආදී ප්‍රභූතන්ත්‍ර බිහි වීමත්

සමගම බලය හා මාධ්‍ය අතර අන්‍යොන්‍ය සම්බන්ධතාව නියුණු ස්වරූපයක් අත්පත් කර ගන්නේ ය. විශේෂයෙන් මෙහිදී සිවිල් සමාජ ක්‍රියාකාරී ආයතන දුර්වල තත්ත්වයක පවතින්නේ නම් ගැටලුව තවත් සංකීර්ණ වන්නේ ය. මෙම බලපෑම් කණ්ඩායම් ධූරාවලිය තුළ ආධිපත්‍යමය තත්ත්වයක් හිමි කර ගන්නේ මූල්‍ය සහ පරිපාලන සම්පත් කණ්ඩායම් වන අතර එම කණ්ඩායම් සංහතික මාධ්‍යයේ පාලනමය උත්තේජනය එය උපායමාර්ගික වුවමනාවන් සඳහා ප්‍රයෝජනයට ගන්නේ ය.

ශ්‍රී ලංකාවේ පශ්චාත් සංග්‍රාමික තත්ත්වයන් මගින් ඇති කොට ඇති සමාජ දේශපාලනික, ආර්ථික, දෘෂ්ටිවාදීමය, වෙනස්කම් සංහතික මාධ්‍ය පද්ධතියේ සන්දර්භමය හා ආකෘතිකමය සංවර්ධනයේ ගතිකත්වය කෙරෙහි නිශ්චිත බලපෑමක් සිදු කරමින් සිටියි. පැහැදිලි ලෙසම දේශපාලන ක්‍රියාවලිය තුළ සංහතික සන්නිවේදන මාධ්‍යයේ භූමිකාව වෙනස්වී ඇති අතර සමකාලීන රූපවාහිනී ප්‍රවෘත්ති විකාශනයනහි දෘෂ්ටිවාදී ප්‍රවණතා තේරුම් ගැනීම සඳහා පශ්චාත් සංග්‍රාමික ශ්‍රී ලාංකේය සමාජ පරිණාමයේ මූල්‍ය ගතික හා ප්‍රවණතා විශ්ලේෂණයෙන් තොරව නොහැකි බව අපගේ විශ්වාසයයි.

වර්තමාන රූපවාහිනී ප්‍රවෘත්ති දෙස ඉතා විමසිල්ලෙන් බලන විට පෙනී යන මූලික කරුණක් වන්නේ සමාජයේ සිදුවන විවිධ සිදුවීම් සිය සංහතික ග්‍රාහකයින්ට ඉදිරිපත් කරනවාට වඩා රූපවාහිනී ප්‍රවෘත්ති මාදිලියට අනුකූල වන ආකාරයට සමාජයේ සිදු වන සිදුවීම් හැඩගස්සවා ඉදිරිපත් කිරීමය. මේ ක්‍රියාවලිය සඳහා මාධ්‍ය බාහිර සාධක තීරණාත්මක භූමිකාවක් ඉටු කරනු ලැබේ. මෙම තත්ත්වය තේරුම් ගැනීම සඳහා සංහතික මාධ්‍ය සන්නිවේදන ක්‍රියාවලිය තුළ රූපවාහිනී ප්‍රවෘත්තිවල ස්ථානය හා කාර්යභාරය විශ්ලේෂණාත්මකව තේරුම් ගත යුතු ය. එසේම සංහතික සන්නිවේදන මාධ්‍ය ක්‍රියාවලිය තුළ දී මාධ්‍ය යථාර්ථය නිර්මාණය වීමේ යන්ත්‍රණය සහ ක්‍රමවේදය පිළිබඳව විචාරාත්මක අවබෝධයක් පැවතීම අත්‍යවශ්‍ය වේ. එසේම සංහතික සන්නිවේදන ක්‍රියාවලියේ දී ඒ සඳහා සහභාගීවන්නන්ගේ ධූරාවලි සහසම්බන්ධතාවන්ගේ අන්‍යොන්‍ය සම්බන්ධතාව වටහා ගැනීම සහ එය සංහතික මාධ්‍ය යථාර්ථය නිර්මාණය කිරීම සඳහා දායක වන ප්‍රමාණය තේරුම් ගැනීම අත්‍යවශ්‍ය කාරණයකි.

අප ඉහත ගෙන හැර දක්වන ලද සාධක ගැඹුරින් විශ්ලේෂණය කිරීමේ දී අපට පෙනී යන මූලික තත්ත්වයක් වන්නේ රූපවාහිනී ප්‍රවෘත්ති සමාජ යථාර්ථය නිරූපණය කරනවා වෙනුවට එය නිර්මාණය කරන බවය. මෙහි දී සිදු වන්නේ සැබෑ ජීවිතයේ සිදුවීම් රූපවාහිනී ප්‍රවෘත්ති මාදිලියට අනුකූල වන ආකාරයට සංස්කරණය කිරීමය. මෙය දෘෂ්ටිවාදී සංවරණයේ මූලධර්මවලට අනුරූපව සිදු වන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් මාධ්‍ය යථාර්ථය නිර්මාණය වේ.

වර්තමාන රූපවාහිනී ප්‍රවෘත්තිවලට ප්‍රස්තුත වන සිද්ධීන් ප්‍රවෘත්ති බවට පරිවර්තනය වීමේ ක්‍රියාවලිය ද අහඹු ක්‍රියාවලියක් නොවන අතර එය නිශ්චිත සහ සාධකවල බලපෑම යටතේ සිදු වන අතිශයින් ම අරමුණු සහගත වූ ද, සවිඥානික වූ ද ක්‍රියාකාරී සමාජ බලවේගවල වුවමනාවන්ගේ අරගලයේ ප්‍රතිඵලයකි. මේ නිසාම සමාජ දේශපාලන ක්‍රියාකාරිකයින් සංරක්ෂණය කිරීමේ ප්‍රබල උපකරණයක් ලෙස භාවිත කිරීමේ අවකාශය විවෘත කරන්නේ ය.

සංහතික රූපවාහිනී මාධ්‍ය ප්‍රවෘත්ති සහ සංහතික ප්‍රේක්ෂකයා අතර සැලකිය යුතු වෙනස්වීම සිදු වෙමින් පවතී. දැන් ප්‍රවෘත්ති සංහතික මාධ්‍ය විසින් පමණක් නොව ඒවායේ පරිභෝජකයන් වන ප්‍රේක්ෂකයින් ද සන්නිවේදනය කරන්නේ ය. විශේෂයෙන්ම මෙවැනි තත්ත්වයක් නව මාධ්‍ය ආශ්‍රිතව සිදුවන සංහතික සන්නිවේදන ක්‍රියාවලියේ දී දක්නට ලැබෙන අතර සංහතික මාධ්‍ය සහ නව

මාධ්‍යයේ තාක්ෂණික, තාක්ෂණිකවේදී , නිර්මාණාත්මක සහ ආකෘතිකමය අන්තර් ක්‍රියාකාරීත්වය තුළ සිදු වන ඒකාග්‍රතා ක්‍රියාවලියේ දී වඩාත් ප්‍රකට කෙරේ. නූතන සංහතික මාධ්‍යයක් වන රූපවාහිනිය සමකාලීන සන්නිවේදන හා මාධ්‍ය තාක්ෂණයේ වර්ධනයන් හේතුකොටගෙන වඩ වඩාත් සමාජීයකරණය වීමේ සංහතිකකරණය වීමේ ප්‍රවණතාව උත්සන්න වී ඇති අතර මෙම සන්දර්භය තුළ සමාජ ජීවිතය දෘශ්‍යකරණය වීමේ සමාජ සංස්කෘතික අවකාශයක අද අපි ජීවත් වෙමු.

මේ අනුව රූපවාහිනී සංහතික මාධ්‍ය ප්‍රවෘත්තිවල වර්ධනයේ අද්‍යතන යුගය එහි දෘශ්‍යකරණ යුගය වශයෙන් හැඳින්විය හැකි ය. මෙහි දී රූපවාහිනී ප්‍රවෘත්ති පඨිතයේ ව්‍යුහාත්මක විකරණයන් හා විපරිවර්තනයන් නිරීක්ෂණය කළ හැකි වීම සාමාන්‍ය දෙයකි. විශේෂයෙන් රූපවාහිනී ප්‍රවෘත්ති පඨිතවල විවිධ මට්ටමේ විවිධ ස්වරූපයේ වෙනස්කම් සිදුවෙමින් පවතින අතර එය සංහතික මිනිසා රූපවාහිනී ප්‍රවෘත්ති ඔස්සේ යථාර්ථය සංජානනය කර ගැනීමේ නව මානයක් හා නව ස්වරූපයක් නිර්මාණය කරයි. පඨිත භාෂණයේ, පඨිත ශෛලියේ පඨිත ආකෘතියේ, පඨිත ෂානරයේ, පඨිත ඉදිරිපත් කිරීමේ, පඨිත සැකසුමේ, පඨිත සංස්කරණයේ, ශ්‍රව්‍ය-දෘශ්‍ය සංකලනයේ පමණක් නොව පඨිත අභ්‍යන්තර ව්‍යුහයේ සන්දර්භයේ අර්ථයේ අදහසේ සහ පරමාදර්ශයේ ඇති වෙමින් පවතින වෙනස්වීම් අනාගත රූපවාහිනී ප්‍රවෘත්තිවල නව තත්ත්වයක් නිර්මාණය වීමට අවශ්‍යයික පසුබිම සම්පාදනය කරන්නේ ය. මෙය ඇත්ත වශයෙන් ම සමාජ විඥාපන හා තොරතුරු ක්ෂේත්‍රයේ සිදුවෙමින් පවතින තත්ත්වයන්ට අනුවර්තනය වීමේ ප්‍රතිඵලය ලෙස අර්ථ දැක්විය හැකි ය. එසේම විවිධ සංහතික මාධ්‍ය ප්‍රභේදයන්ගේ අභිසාරිතා ප්‍රවණතා අන්‍යෝන්‍ය වශයෙන් ක්‍රියාකිරීම නිසා ද රූපවාහිනී ප්‍රවෘත්ති ක්ෂේත්‍රයේ මේ නව තත්ත්වය නිර්මාණය වීමට ඉවහල් වී ඇති බව පෙන්වා දිය යුතු ය. මෙය සමකාලීන සංහතික සන්නිවේදනයේ සමාජයීය පරිපාලන තාක්ෂණික කර්මාන්තමය, ව්‍යාපාරික කළමනාකරණ ක්ෂේත්‍රවල පමණක් නොව සංහතික රූපවාහිනී පඨිත මට්ටමින් ද සිදු වන්නේ ය. මේ තත්ත්වය එක් එක් සංහතික මාධ්‍යයට අදාළව සිදු වන අතර ම අන්තර් සංහතික මාධ්‍ය ස්වරූප අතර ද සිදු වීම අද අප සමාජ ජීවිතයේ සාමාන්‍ය දෙයකි. නිදර්ශනයක් වශයෙන් සමකාලීන පුවත්පත්වල ප්‍රවෘත්තිකරණය රූපවාහිනීකරණය වීම (Televisionalization) මෙහි අර්ථය වන්නේ මුද්‍රිත සංහතික මාධ්‍යයට සාපේක්ෂව එහි දෘශ්‍ය සංරචක ප්‍රසාරණය වීම සහ ලිඛිත පඨිත සංරචක අවම ප්‍රමාණවීම දැක්විය හැකි ය. එසේම රූපවාහිනී සංහතික මාධ්‍ය පඨිත තුළ වැඩි වැඩියෙන් පුවත්පත් මාධ්‍යයට ආවේණික ක්‍රමවේද භාවිතය වර්ධනය වී නිරීක්ෂණය කළ හැකි ය. මේ අනුව අද්‍යතන රූපවාහිනී ප්‍රවෘත්ති පඨිතවල අන්තර් සංහතික මාධ්‍ය ගතිලක්ෂණ වර්ධනය වෙමින් ක්‍රමානුකූලව සාම්ප්‍රදායික, සම්භාව්‍ය ස්වරූපය වෙනස් වෙමින් පවතින යුගයක අද අපි ජීවත් වෙමු. මේ විඥාපන යුගය තුළ මිනිසා යථාර්ථය සංජානනය කර ගන්නා ආකාරය පවා වෙනස්වීමට ලක් වන්නේ ය. රූපවාහිනී දර්ශනවල ගතිකත්වය, වේගය ඉහළ යන අතර සමාජ යථාර්ථයට මිනිසා දක්වන සම්බන්ධතාව විපර්යාසයට ලක් වන්නේ ය. එසේම රූපවාහිනී ප්‍රවෘත්ති නිමාවක් නැති සංක්‍රාන්ති කතා වස්තු ප්‍රවාහයක් බවට පරිවර්තනය වන්නේ ය. රූපවාහිනී විඥාපනය ආරම්භයක් හා අවසානයක් රහිත ප්‍රබල ක්‍රමානුකූලතාවක් නැති වර්ධනය වූ ස්වභාවයක් දරන්නේ ය. එකිනෙකට වෙනස් රූපවාහිනී විඥාපන කාණ්ඩ (තොරතුරු සමූහ) එකට ඒකාබද්ධ වන්නේ ප්‍රවෘත්ති වැඩසටහන් තුළ දී වෙළෙඳ දැන්වීම් සහ සංගීතය ආදිය උපයෝගී කොටගෙන ය. වර්තමානයේ රූපවාහිනී ප්‍රවෘත්ති යන සංකල්පය නිස්සාර සංකල්පයක් බවට පරිවර්තනය වීමේ නැඹුරුවක් ඇතිවිය හැකි ය. මේ නිසා කලාන්තරයක් තිස්සේ මිනිස් විඥානයෙහි හැඩ ගැසුණු සමාජය, ලෝකය,

මිනිස් ජීවිතය බරපතළ කාරණයක්ය යන ආකල්පය බිඳ වැටෙමින් පවතී. මේ අතර වාණිජ විනෝදය මුළු සමාජයම, සමස්ත පුද්ගල ජීවිතයම වැළඳගත් මහා ප්‍රවණතාවක් ලෙස ව්‍යාප්ත වන්නේ ය. සමස්ත රූපවාහිනී ප්‍රවෘත්තිවලට මූලික අරමුණ වී ඇත්තේ දශලක්ෂ සංඛ්‍යාත සංහතිකයින්ගේ නැරඹීම මත සිය ආධිපත්‍ය පවත්වාගෙන යෑමය. ප්‍රවෘත්ති සංකල්පයේ සියලු මූලධර්ම ආචාරධර්ම දක් ක්‍රියා කරන්නේ එම අරමුණ කෙසේ හෝ ඉටු කර ගැනීමට බව පෙනේ.

වර්තමානයේ රූපවාහිනී ප්‍රවෘත්ති සිය පරිණාමයේ නව යුගයකට අවතීර්ණ වී ඇති අතර, එය සම්පූර්ණයෙන්ම මේ අප ජීවත් වන යුගයේ සමාජ, සංස්කෘතික සහ දේශපාලන දෘෂ්ටිවාදී සැකැස්ම නිරූපණය කරන හා ඊට අනුරූපවන ස්වරූපයකි. ක්‍රමානුකූලව රූපවාහිනී සංහතික ප්‍රවෘත්ති පඨිත අධි යථාර්ථමය ගුණාංගයන් අත්පත් කරගනිමින් සිටී. යථාර්ථමය වශයෙන් රූපවාහිනී ප්‍රවෘත්ති ප්‍රකාශන පඨිත අධි යථාර්ථමය ගුණාංගයන් අත්පත් කරගනිමින් සිටී.යථාර්ථමය වශයෙන් රූපවාහිනී ප්‍රවෘත්ති ප්‍රකාශන පඨිතයන්ගේ පඨිතයක් ලෙස විමසා බැලිය හැකිය. විශේෂයෙන් ප්‍රවෘත්ති පඨිතවල තොරතුරු හා සාධක සංවිධානය සංරචනය සුපුරුදු රේඛීය මාදිලියේ සිට අරේඛීය මාදිලියක් දක්වා අතික්‍රමණය වී ඇති අතර, සංහතික ප්‍රේක්ෂකයින්ට රූපවාහිනී ප්‍රවෘත්ති පරිහරණය කිරීමේ නම්‍යශීලිතාව සහතික කරමින් විවිධ සාධකයන්ගේ රඳා පැවැත්ම මත පඨිතයේ අභ්‍යන්තර සංඝටකවල ස්ථානය එකිනෙක මාරුකළ හැකිය. ඒ අනුව සංහතික රූපවාහිනී ප්‍රේක්ෂකත්වය සිය අභිමතය පරිදි අදාළ පඨිතය කියවා ගනු ලැබේ. සමකාලීන රූපවාහිනී ප්‍රවෘත්ති පඨිත බොහෝ විට බහුස්තරීය බහු සැලසුම්ගත ව්‍යුහයක් පිළිබිඹු කරන අතර ප්‍රවෘත්තියේ පොදු හැඟීම හැඩගැස්වීම සඳහා සෑම මාධ්‍යයක්ම සහභාගි වන බව සඳහන් කළ යුතුය. ප්‍රවෘත්ති පඨිතයේ සංඝටක සංයෝජනය, ඒවා ස්ථානගත කිරීම, භූමිකාමය සංකල්පීය ව්‍යුහය අභ්‍යන්තර ව්‍යුහය අභ්‍යන්තර පඨිතමය සම්බන්ධතා සහ භාෂා ස්වරූපය එහි ද ප්‍රයෝජනයට ගනු ලබන්නේ අදාළ ප්‍රවෘත්ති පඨිතයේ මූලික ආකල්පය හැඩගැස්වීමේ අරමුණට යටත්ව ය.

රූපවාහිනී ප්‍රවෘත්ති ප්‍රකාශන තුළ පඨිතය නිර්මාණයවීමේදී ඉතා වැදගත් උපයෝග යථාවදී කර්තව්‍යයක් වන්නේ ප්‍රේක්ෂකයාට පරිභෝජනය කිරීමට පහසු වන ආකාරයට අදාළ තොරතුරු, කරුණු ව්‍යුහගත කිරීමයි. රූපවාහිනී ප්‍රවෘත්ති ප්‍රකාශවල සංඝටක තොරතුරු එකිනෙකට සම්බන්ධවිය යුත්තේ ප්‍රේක්ෂකයාට උපරිම මට්ටමින් තොරතුරු සංජානනය කර ගැනීමට හැකි වන අන්දමටය. ප්‍රේක්ෂකයාට ප්‍රවෘත්ති සම්ප්‍රේෂකගේ චින්තනය ආකල්පනය කිරීම පහසු විය යුතුය. එසේම නාලිකාවේ ප්‍රජනනාත්මක ශෛලිය ද සංහතික ප්‍රේක්ෂක තොරතුරු සංජානනය කෙරෙහි බලපාන්නේ ය. රූපවාහිනී නාලිකාවල දෘෂ්ටිවාදී පරිපාකය ද ප්‍රේක්ෂකයාට රූපවාහිනී ප්‍රවෘත්ති පහසුවෙන් වටහාගැනීම සඳහා බලපාන්නේ ය.

සමස්තයක් වශයෙන් රූපවාහිනී ප්‍රවෘත්ති ප්‍රකාශවල භාෂා ශෛලිය කතා කරන භාෂාවට සමීප අතර එයට යම් යම් අවස්ථාවලදී රාජකාරී, විද්‍යාත්මක, කලාත්මක ආදී වෙනත් ශෛලීන් ද සංයෝජනය වීමේ ලක්ෂණයක් නිරීක්ෂණය කළ හැකි ය. රූපවාහිනී මාධ්‍ය ආරම්භයේදී භාවිත වූ ශාස්ත්‍රීය හා සාහිත්‍ය ශෛලියට සමීප භාෂා භාවිතය එය සංහතික මාධ්‍යයක් ලෙස වර්ධනය වත්ම අවම ප්‍රමාණ වී යැමේ ප්‍රවණතාවයක් ප්‍රදර්ශනය වේ.

අද්‍යතන රූපවාහිනී ප්‍රවෘත්ති ප්‍රකාශ එක ආකාරයේ සැලැස්මකට, ස්වරූපයකට ආකෘතියකට සීමා වී ඇති අතර එකම පොදු ශෛලියක් හා එකම පොදු සීමිත වචන මාලාවකට සීමා වී ඇත. සමකාලීන රූපවාහිනී ප්‍රවෘත්ති කරණයේ සහ ප්‍රකාශනයේ මුඛ්‍ය අභියෝගයක් වී ඇත්තේ

මෙම පටු රාමුවෙන් ඉවත්වීමේ සංකීර්ණතාව සහ ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමේ මීට වඩා කාර්යක්ෂම හොඳ ඵලදායිතා ක්‍රමවේද ගවේෂණය කිරීමයි. රූපවාහිනී ප්‍රවෘත්ති පඨිතවල මෙම තත්ත්වය හැඩගැසීම කෙරෙහි මාධ්‍ය වෙළෙඳපොළේ සංයුංජනය, සමාජයේ දේශපාලන සහ දෘෂ්ටිවාදී තත්ත්වය බලපානු ලැබේ.

සමාජයේ දෛනිකව සිදුවන සිදුවීම් අතරින් වඩාත්ම වැදගත් යැයි, අදාළ මාධ්‍ය ආයතනයේ ප්‍රවෘත්තිවලට අනුකූලව සැලකනු ලබන සිද්ධි රූපවාහිනී ප්‍රවෘත්ති බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය සංකීර්ණ වූවකි. එය එක් අතකින් තාක්ෂණික හා තාක්ෂණිකවේදී ක්‍රියාවලියක් වන අතර අනෙක් අතින් එය සමාජ, දේශපාලන දෘෂ්ටිවාදී ක්‍රියාවලියකි. එසේම මෙම රූපවාහිනී ප්‍රවෘත්ති බවට පරිවර්තනය වන සිද්ධීන් එක් අතකින් සංහතික මාධ්‍යයේ තර්කනයට අනුකූලවිය යුතු අතර අනෙක් අතින් එය සංහතික මාධ්‍ය සමාගම් ප්‍රජනන ශෛලියට අනුව විකරණය විය යුතුය.

සිද්ධිය ගොඩනැගීමේ ක්‍රියාවලිය වෙත රූපවාහිනී නිෂ්පාදනයේ තාක්ෂණික විශේෂතා සහ ප්‍රේක්ෂක සංජනයේ ස්වරූපය බලපාන බව සඳහන් කළ යුතුය. රූපවාහිනී ප්‍රවෘත්ති පඨිතයන් බවට යම් සිදුවීමක් පත්වන්නේ හුදු අහඹු ආකාරයකට නොව, රූපවාහිනී ප්‍රවෘත්ති කාරකයින්ගේ, අදාළ මාධ්‍ය ආයතනයේ, සමාජ, දේශපාලන දෘෂ්ටිවාදී පරිස්ථිතියේ බලපෑම යටතේ ය. එසේ රූපවාහිනී සංහතික ප්‍රේක්ෂකයින්ටත් ගුණාත්මකභාවය ප්‍රවෘත්ති නිෂ්පාදකයින් වෙත තීරණාත්මකව බලපාන බව ද අවධාරණය කළ යුතුය. රටේ දේශපාලන සංස්කෘතිය ද සමකාලීන රූපවාහිනී සංහතික ප්‍රේක්ෂකයින්ගේ තත්වයට සමරූපීවන ආකාරයට අනුවර්තනය වීමද පොදු ප්‍රවණතාවක් බවට පත් වී තිබේ.

වර්තමාන රූපවාහිනී ප්‍රවෘත්ති පඨිත නිෂ්පාදන ක්‍රියාවලියේ දේශපාලන ක්‍රියාවලිය හා වෙළෙඳපොළ ක්‍රියාවලිය සමකාලීකරණය, ඒකකාලීකරණය වීමේ නැඹුරුව ප්‍රවණතාවක් ලෙස වර්ධනය වන බව පෙනේ. මෙය පශ්චාත් සංග්‍රාමික ශ්‍රී ලංකේය රූපවාහිනී ප්‍රවෘත්ති ක්ෂේත්‍රය විශ්ලේෂණය කිරීමෙන් පෙනීයන්නේ ය. එනම් වර්තමාන ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රියාවලියේ තර්කනයට සමරූපියව, සමකාලීනව වෙළෙඳපොළ සහභාගය ක්‍රියා කරන බවයි. සමාජයේ වැදගත් සිද්ධීන් සම්බන්ධ ප්‍රවෘත්ති සංකෝචනයට ලක් කරමින් ප්‍රවෘත්තිවල අන්තර්ගතයේ ඍබුද්ධික අදහස් කප්පාදුවට ලක් කරනු ලැබේ. මෙහිදී වැදගත් සමාජ, දේශපාලන, ආර්ථික ප්‍රශ්න විනෝදාත්මක හා නාට්‍යකරණයකට ලක් කරමින් ඒවා සංහතික විඥානයේ කේන්ද්‍රයෙන් පරිබාහිර පරිධියෙහි ස්ථාන ගතකෙරේ.

මේ අනුව පොදුවේ සලකා බලන විට සමකාලීන රූපවාහිනි ප්‍රවෘත්ති පාලක පන්තියේ ආධිපත්‍ය දෘෂ්ටිවාදය තහවුරු කිරීමේ යෙදී සිටින බව නව මාක්ස්වාදී මාධ්‍ය අධ්‍යයන පර්යේෂකයෝ පෙන්වා දෙති.

සංහතික මාධ්‍යයේ අභ්‍යන්තර තර්කනය වඩ වඩාත් රූපවාහිනී ප්‍රවෘත්ති විනෝදනය දෙස යොමු කිරීමට ප්‍රයත්න දරන අතර එහිදී පුද්ගලික සිද්ධි සංහතික සිද්ධි බවටත් සංහතික සිද්ධි පුද්ගලික සිද්ධි බවටත් පරිවර්තනය කිරීමේ ප්‍රවනතාව වේගවත් වන්නේය. මෙම ප්‍රවෘත්තිකරණයේ ස්වභාවය සම්භාව්‍ය ප්‍රවෘත්තිකරණයේ තර්කනය යටපත් කොට විනෝදස්වාදයේ සහ නාටකීකරණයේ තර්කනය ඉස්මතු කරන්නේය. බොහෝ ශ්‍රී ලංකේය රූපවාහිනී නාලිකා ප්‍රවෘත්ති නිරීක්ෂණය කිරීමෙන් මෙය හඳුනාගත හැකිය.

මේ අනුව සලකා බලන විට සමකාලීන සමාජ යථාර්ථය නිර්මාණය කිරීමේ තිල දෘෂ්ටිවාදී සංවරණ ක්‍රමවේදය ඔස්සේ රූපවාහිනී ප්‍රවෘත්ති තීරණාත්මක භූමිකාවක් ඉටු කරනු ලැබේ. වර්තමාන අර්ථයට අනුව සමාජ යථාර්ථය සංජානනය කර ගැනීමේ සහ අර්ථකථනය කිරීමේ ඓතිහාසික වශයෙන් හැඩගැසුණු වඩාත්ම සැලකිය යුතු ස්වරූපයක් වශයෙන් රූපවාහිනී ප්‍රවෘත්ති හැඳින්විය හැකි ය. වර්තමාන මානව වර්ගයාගේ දෛනික සංහතික විඥානය හැඩගැස්වනු ලබන ප්‍රබලතම මාධ්‍යයක් ලෙස රූපවාහිනිය හැඳින්විය හැකි අතර, එහි දී රූපවාහිනී ප්‍රවෘත්ති විශේෂ වන්නේය. විශේෂයෙන් අධිපතිවාදී දෘෂ්ටිවාදයට අනුරූපව දෛනිකව වෙනස් වන යථාර්ථය පිළිබඳව සංහතික විඥානය, ආකල්පය හැඩගස්වනු ලබන ක්‍රියාවලියේ දී රූපවාහිනී ප්‍රවෘත්ති වලට හිමි වන්නේ ප්‍රමුඛම ස්ථානයකි. ඇත්ත වශයෙන්ම රූපවාහිනී ප්‍රවෘත්ති යථාර්ථය පිළිබඳ සත්‍යවාදී වූ ද අපක්ෂවාදී වූ ද, නිදහස් වූ ද, යථාර්ථවාදී වූ ද පරාවර්තනයකට වඩා සංවේද්‍ය දෘෂ්ටි වාදී අර්ථකථනාත්මක නිරූපණයකි.


ආශ්‍රිත ග්‍රන්ථ

(1) Barker, C (1997) Global Television An Introduction, Oxford : Blackwell.

(2) Bell, A (1991) The Language of News media, Oxford, Blackwell.

(3) Berndette Casey, Neil Casey, Ben Catvert, Liam French and Justin Lewis (2004) Key concepts in television studies, London and New York.

(4) Annette Hill (2007) Reality Tv, Audiences and popular factual television, Routldge, London and New York.

(5) Lamge John (1998) Tabloid television popular journalism and other news, routledge London.

(6) Paul A, taylor and Li marris (2010) sritical theories of mass Media: Then and Now Newdelhi.

(7) Debord. g (1991) Comments on the society of the spectacle Trans m.gmrie. London.

(8) Victoria O Donnell (2007) Television criticism Sage Puthications, London.

(9) Roberta e. Person and Philip Sinpson (eds.) (2001) critical Dictionary of film and television theory Routledge, London and New York.

(10) James Watson and Anne hill (2003) Dictionary of Media and Communocation Studies London.

(11) වීරසිංහ, ටී. (2012) මාක්ස්වාදී සහ නවමාක්ස්වාදී සංහතික මාධ්‍ය න්‍යාය, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.

(12) සිරිබද්දන, ලලිතා (2012) නූතන සමාජ අර්බුදය සහ රූපවාහිනී සන්නිවේදනය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ මරදාන.

(13) හේරත්, සමන්ත (2009) ගෝලීයකරණය සංස්කෘතිය හා සන්නිවේදනය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.